L

Article 13(1)


# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date } 2019.12.04

පැමිණිලිකරු : සමන්ත කෝරලේආරච්චි මහතා,
අංක : 119/2, 3 වන පටුමග,
සපුමල් පාර, හලාවත.

වගඋත්තරකරුවන් :

1. වෛද්‍ය දිනුෂා ප්‍රනාන්දු මිය,
අධ්‍යක්ෂ, මහ රෝහල,
හලාවත.

2. මූලස්ථාන පොලිස් පරික්ෂක,
පොලිස් ස්ථානය,
හලාවත.

3. උප පොලිස් පරීක්ෂක අමරසිරි මහතා,
පොලිස් ස්ථානය,
හලාවත.

4. පො.කො. 58289 ප්‍රියංකර මහතා,
පොලිස් ස්ථානය,
හලාවත.

5. පො.කො. ගුණසේකර මහතා,
පොලිස් ස්ථානය,
හලාවත.

<u>පැමිණිලි අංකය : **HRC/2753/15**</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා සමස්ත ලංකා සුවසේවා සංගමයේ සභාපති බවත්, හලාවත


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

මහරෝහලේ ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා 2015.07.28 වන දින රෝහල් අධ්‍යක්ෂවරියට ෆැක්ස් මගින් පූර්ව දැනුම්දීමක් සිදුකොට 2015.07.31 වන දින හලාවත මහ රෝහලේ වෘත්තිය සමිති සාකච්ඡාවට සහභාගි වී සිටියදී පැමිණිලිකරු සහ ලංකා සුවසේවා සංගමයේ භාණ්ඩාගාරික හලාවත පොලිසිය මගින් පැමිණිලිකරුව අත්අඩංගුවට ගත් බවත්ය.

පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, තමා වෘත්තිය සමිති නායකයෙකු බවත්, නියමිත පරිදි ආයතන ප්‍රධානියා දැනුවත් කර රෝහල් භූමියට පැමිණි අතර, එහිදී සේවක ගැටළු සාකච්ඡා කිරීමක් මිස ඡන්ද රැස්වීමක් නොපැවැත්වූ බවත්, ඡන්ද අපේක්ෂකයෙකු ලෙස කිසිදු මැතිවරණ ප්‍රචාරක පත්‍රිකාවක් බෙදා හැරීමක් සිදු නොකළ බවත්ය. මෙම අත්අඩංගුවට ගැනීම නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාවෙහි සඳහන් වන සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම 13 වන ව්‍යවස්ථාවේ සඳහන් අත්තනෝමතිකව අත්අඩංගුවට ගැනීමෙන් වැලකීමේ අයිතිවාසිකම හා 14 වන ව්‍යවස්ථාවේ සඳහන් වෘත්තිය සමිතියකට බැඳීම හා කටයුතු කිරීමේ අයිතිය උල්ලංඝනය කර ඇති බවද දක්වා ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

01 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම -

සෞඛ්‍ය අමාත්‍යංශයේ ලේකම්වරිය විසින් අමාත්‍යංශයේ සියළු රෝහල් හා ආයතන ප්‍රධානීන් වෙත නිකුත් කොට ඇති 2015 ජුලි මස දින රහිත චක්‍රලේඛ අංක : CA/GCB/ච.ලේ.වෙ./2015 අනුව පාර්ලිමේන්තු මැතිවරණයේදී, රාජ්‍ය දේපළ පක්ෂ/අපේක්ෂකයින් ප්‍රවර්ධනය සඳහා ගැනීම වැළැක්වීම සඳහා ක්‍රියා කිරීමත්, රාජ්‍ය ආයතන විසින් ප්‍රසිද්ධ ස්ථාන වල සහ මහජනතාවට පෙනෙන පරිදි රාජ්‍ය ආයතන පරිශ්‍රවල පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධනයට හේතු වන පරිදි ප්‍රදර්ශනය කරන ප්‍රචාරක පුවරු, චිත්‍ර යනාදිය ඉවත් කර ගැනීමට පියවර ගැනීමත්, යන කරුණු සම්බන්ධයෙන් දක්වා ඇති බව සඳහන් කර ඇත.

ඒ අනුව මෙම පැමිණිලිකරු වෘත්තිය සමිතිය ලෙසට 2015.07.28 වන දින ෆැක්ස් මගින් තමා වෙත කරන ලද දැනුම්දීමට අනුව ඒ සඳහා අවසර දිය නොහැකි බවට අදාළ වෘත්තිය සමිති සාමාජිකයන්ට දැනුම්දුන් බවද සඳහන් කර ඇත. නමුත්, ඒ සම්බන්ධයෙන් තැකීමක් නොකොට පැමිණිලිකරු අදාළ රැස්වීම පැවැත්වූ නිසා ඒ බව පොලිසියට දැනුම්දීමට සිදුවූ බවත්, ඒ අනුව පොලිසිය විසින් ඉදිරි පියවර ගත් බවත් සඳහන් කර ඇත. ඒ අනුව තමා සිදුකරන ලද්දේ ලේකම්වරයා සහ මැතිවරණ කොමසාරිස්වරයා නිකුත් කර ඇති චක්‍රලේඛනයට අනුව කටයුතු කිරීම පමණක් බවත්, එම චක්‍රලේඛනයේ 12(2) වගන්තියට අනුව ශ්‍රවණාගාර ශාලා පහසුකම් සහ රාජ්‍ය ආයතන තුළ අත්පත්‍රිකා බෙදා හැරීම යටතේ අපේක්ෂක ඡන්ද ප්‍රවර්ධන කටයුතු සඳහා ලබාදීම නොකළ යුතු බවට දන්වා ඇති නිසා එම චක්‍රලේඛනය ක්‍රියාත්මක කිරීමට තමා බැඳී සිටි බව තවදුරටත් සඳහන් කර ඇත.

දෙවන වගඋත්තරකාර මූලස්ථාන පොලිස් ස්ථානාධිපති, හලාවත කොමිෂන් සභාවට වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, එමගින් ප්‍රකාශ කර ඇත්තේ, හලාවත රෝහලේ ඡන්ද අත්පත්‍රිකා බෙදා හරින බවට ලද පණිවිඩයට එම රෝහලට ගොස් රෝහලේ වෛද්‍ය අධිකාරිගෙන් පැමිණිල්ලක් සටහන් කර ගැනීමෙන් පසු අදාල සාක්ෂි සටහන් කර ගැනීමෙන් පසුව ඡන්ද පත්‍රිකා රෝහල තුළ බෙදා හරින බව අනාවරණය වූ බැවින්, පැමිණිලිකරුව ඡන්ද පත්‍රිකා බෙදා හැරීම යටතේ මැතිවරණ පනතේ නීති ප්‍රකාරව අත්අඩංගුවට ගනු ලැබූ බවත්, අත්අඩංගුවට ගත් සැකකාරිය භාරයේ තිබූ ඡන්ද පත්‍රිකා කිහිපයක් සමග පොලිස් ස්ථානයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ අතර, සිද්ධිය සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කර සැකකරු සහ සැකකාරිය බී වාර්තාවක් මගින් අධිකරණයට ඉදිරිපත් කළ බවත්, අධිකරණයේදී ඇප මත සැකකරුවන් මුදාහැර ඇති බවත් ය.

නිරීක්ෂණ :-

පැමිණිලිකරු සමස්ත ලංකා සුවසේවා සංගමයේ සභාපති ලෙස කටයුතු කරන අතර, ඒ අනුව පැමිණිලිකරු වෘත්තිය සමිති ව්‍යාපාරයේ කටයුතු කරන පුද්ගලයෙක් බව නිරීක්ෂණය වේ. මෙම පැමිණිලිකරු පුත්තලම දිස්ත්‍රික්කයේ ජනතා විමුක්ති පෙරමුණේ කණ්ඩායම් නායකයා ලෙස මහ මැතිවරණයට ඉදිරිපත් වී ඇත.

දෙවන වගඋත්තරකරු වන හලාවත මූලස්ථාන පොලිස් පරීක්ෂක ඇතුළු අත්අඩංගුවට ගත් නිලධාරින් සඳහන් කර ඇත්තේ හලාවත මහ රෝහලේ අධ්‍යක්ෂිකා, වෛද්‍ය දිනූෂා ප්‍රනාන්දු මහත්මියගේ දැන්වීමක් මත පොලිස් ස්ථානයට පැමිණ පැමිණිල්ල වාර්තා කිරීමෙන් අනතුරුව සාක්ෂි ද සටහන් කර අදාල අත්අඩංගුවට ගැනීම සිදුකළ බවයි.

පැමිණිලිකරු විසින් තමා වෘත්තිය සමිති නායකයෙක් බැවින් වෘත්තිය ගැටළු සම්බන්ධයෙන් සාකච්ජා කිරීම සඳහා අධ්‍යක්ෂකවරයා වෙත සාකච්ජාවක් ලබාදෙන ලෙසට ඉල්ලා සිටි බවත්, එය මග හැරීමෙන් පසුව සේවකයන්ගේ ඉල්ලීම් මත සේවක ප්‍රශ්න සාකච්ජා කිරීම සඳහා අධ්‍යක්ෂතුමියට ලිඛිත දැනුම්දීමකින් පසුව රෝහල වෙත ගිය බවත් ප්‍රකාශ කර ඇත. එම ඉල්ලීම් කරන ලද ලිපියේ පිටපතක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව එම කරුණු සත්‍ය බවට තහවුරු වේ.

තවද, පැමිණිලිකරුවන්ට විරුද්ධව මැතිවරණ සමයේ අත්පත්‍රිකා බෙදා හැරීම සහ ඡන්ද පත්‍රිකා බෙදා හැරීම සම්බන්ධයෙන් හලාවත මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක : 77084/15 යටතේ නඩුවක් විභාග වූ අතර, මේ වනවිට එම නඩුවෙන්ද පැමිණිලිකරුවන්ව නිදොස් කොට නිදහස් කර ඇති බවද නිරීක්ෂණය වේ.

නිගමනය :-

ඉහත කරුණු අනුව 1 වන වගඋත්තරකරු විසින් පැමිණිලිකරුට විරුද්ධව පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්, එම පැමිණිල්ල පොලිසිය විසින් විමර්ශනයකට ලක් කළ බවට සඳහන් වුවත්,

අදාළ පැමිණිල්ල නිසි විමර්ශනයකින් තොරව අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බවත් අනාවරණය වී ඇත.

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 32 වන වගන්තියට අනුව පුද්ගලයෙකු සංඥය වරදක් යටතේ අත්අඩංගුවට ගැනීමට පැමිණිල්ලක්. තොරතුරක් තිබිය යුතු අතර. එම පැමිණිල්ල හෝ තොරතුර නිසි විමර්ශනයකට ලක් කිරීමෙන් අනතුරුව අත්අඩංගුවට ගැනීම සිදුකළ යුතු වේ.

පැමිණිලිකරුට විරුද්ධව ඉදිරිපත් කර ඇති නඩුවේදී ගරු අධිකරණයෙන්ද ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකරු මැතිවරණ ප්‍රචාරක කටයුතු සිදුකරන බවට හා මැතිවරණ නීති උල්ලංඝනය කරන බවට සාක්ෂි මගින් තහවුරු වී නැති බැවින් ඔහුව නිදොස් කොට නිදහස් කරන බවයි.

විමර්ශනයේදී ඉදිරිපත් වී ඇති මෙකී සමස්ත කරුණු වලට අනුව නිසි විමර්ශනයකින් තොරව පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මෙම පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය –:

> පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට කටයුතු කළ 2, 3, 4, සහ 5 වන වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට වූ අගතිය වෙනුවෙන් රු. 10,000/- ක මුදලක් ගෙවිය යුතුය.

2019.12.27 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාරිය විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රමණි මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

සැ.යු – අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැලැස්විය යුතුය.

B/